

‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු


| 59 වන කාණ්ඩය | බු.ව. 2560 ඉල් මස පුරපසළොස්වක ද ව්‍ය.ව. 2016 නොවැම්බර් මස 14 වන ද | 07 වන කලබ |
| --- | --- | --- |


# අමර සර මිලින විය

පණ්ඩිත් ඩබ්. ඩී. අමරදේවයන් ගේ අමර මෙහෙවර වෙනුවෙනි.



මියුරු සගයු සර සුසිනිඳු කළ　　කිවිඳු
ඉවුරු පුළුල් කළ හෙළ ගීයෙහි　　සුමුදු
මහරු මිනිස්කම් ගජමුතු කොට　　පැළැඳු
කවුරු ඔබට සරි වෙති ඔබ ම ය　　සරිඳු

කුමරතුඟුන් ගේ හෙවණෙහි පහස　　ලැබ
නියර දැන බසෙහි ඉන් ඔද වෙමින්　　ඔබ
සුසර කළෝ සුබස ද කරමින් ම　　පොබ
පවර වූහ ඉන් ඔබ මියැසියෙන්　　සබ

දුලබ මියුරු සර සුලකළ හඬ　　ගැඹුරු
කළඹවයි හෙට ද රස හදවත්　　මියුරු
ගදඹ වෙසරදුනි දුළ මහ ගුණ　　සයුරු
දුලබ ඔබ නමට පිබිදෙයි හෙළ　　තඹුරු

\- අනඳ



# බෞද්ධයා

*අග්ගමහාපණ්ඩිත අතිපූජ්‍ය මඩිහේ පඤ්ඤාසීහ*
*මහානායක ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි*

**බුදුරජාණන් වහන්සේ ශාස්තෘන් කොට අදහන්නෝ බෞද්ධයෝ නම් වෙති.** ඔවුහු භික්ෂු - භික්ෂුණී - උපාසක - උපාසිකා යැයි සිවු කොටසකට බෙදෙති. එයින් උපාසක - උපාසිකාවෝ ගිහි බෞද්ධයෝ ය. ඔවුහු ද නමින් පමණක් බෞද්ධයෝ ය, නියම බෞද්ධයෝ යැයි දෙ කොටසක් වෙති.

බෞද්ධ මවුපියන් ගේ දරුවකු වීම ය, බෞද්ධ ගෙදරක ඉපැදී හැදී වැඩීම ය, බෞද්ධ නාමයක් තිබීම ය, නිකම් චාරිත්‍රයක් වශයෙන් තෙරුවන් සරණ යෑම ය, පන්සල් යෑම ය, බෞද්ධ උත්සවවලට සහභාගී වීම ය යන ආදී කරුණුවලින් පමණක් බෞද්ධ වූවෝ **නමින් පමණක් බෞද්ධයෝ ය.**

බුද්ධ කාලයෙහි බෞද්ධ යන නම වෙනුවට භාවිත කෙළේ උපාසක යන නාමය යි. එහෙයින් "**රතනත්තයං උපාසතීති උපාසකො** = තෙරුවන් ගුණ දැන ළංව ආශ්‍රය

කරන්නා උපාසකයා යයි විවරණ කළහ. බෞද්ධයා කවරෙක් දැයි අසන ලද ප්‍රශ්නයකට පිළිතුරු වශයෙන් බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

**"යමෙක් බුදුන් සරණ ගියේ ද, දහම් සරණ ගියේ ද, සඟුන් සරණ ගියේ ද හෙතෙමේ උපාසකයා = බෞද්ධයා නම් වේ."**

තෙරුවන් සරණ ගියේ බෞද්ධයා නම් වේ යයි ප්‍රකාශ වුව ද නිකම් **"බුද්ධං සරණං ගච්ඡාමි"** කී පමණින් සරණ ගියා වන්නේ නැත. තෙරුවන් ගුණ දැනගෙන, සරණ යන්නේ කුමකට දැයි වටහා ගෙන, සසර දුක් නැති කොට නිවන් සුව විඳීමට තෙරුවන් ඒකාන්තයෙන් පිහිට වේය යන සිතින් සරණ යෑමෙන් ම සරණ ගියා වෙයි. අනතුරුව නියම බෞද්ධයකු වීමට උවමනා කරන ප්‍රතිපත්ති පිරීම ද, පිරිහෙන කරුණු දැන ගෙන එයින් දුරුවීම ද, තමනට අයත් ගුණ සම්පූර්ණ කිරීම ද ඉතා අවශ්‍ය ය.

පඤ්ච දුශ්චරිතයෙන් වැළැකී සිල්වත් වීම ද, මසුරුමල දුරු කොට **ත්‍යාගශීලි** වීම ද, තමන් අදහන ශාස්තෘන් වහන්සේ ගේ බුදුබව විශ්වාස කරන **ශ්‍රද්ධාවන්තයකු** වීම ද, ලෝකයෙහිත් පඤ්චස්කන්ධයෙහිත් ඇති තතු අවබෝධ කරන **ප්‍රඥාවෙන්** යුක්තවීම ද යන මේවා නියම බෞද්ධයන් වීමට තිබිය යුතු ප්‍රධාන ප්‍රතිපත්තීහු ය. එසේ ම ආජීවය ද ධාර්මික විය යුතු ය.

බෞද්ධයාගේ පිරිහීමට හේතු වන කරුණු අතුරෙන් ප්‍රධාන ධර්ම සත මෙසේ ය.

1. භික්ෂූන් ගේ ආශ්‍රයෙන් ඈත්වීම, 2. බණ ඇසීමට සැලකිල්ලක් නොදැක්වීම, 3. අටසිල් ආදී ඉහළ සිල් නොරැකීම, 4. භික්ෂූන් වහන්සේලා කෙරෙහි කලකිරීම, 5. සිදුරු සොයනා අදහසින් බණ ඇසීම, 6. මේ ශාසනයෙන් පිටත්හි දක්ෂිණාර්හයන් සෙවීම, 7. සංඝයා අමතක කොට පළමුව තාපසයන් පිදීම යන මේ කරුණු සත නිසා බෞද්ධයා ගුණයෙන් හා නුවණින් ද මෙලොවින් හා පරලොවින් ද පිරිහෙයි.

බෞද්ධයන් තුළ තිබිය යුතු විශේෂ ගුණ දශයක් ද වෙයි.

1. සංඝයා හා සමාන සුව දුක් ඇත්තෙක් වේ. එසේ වීමට සංඝයාගේ සුව දුක් සෙවිය යුතු ය. බෞද්ධයන් භික්ෂූන් ගේ සුව දුක් නිතර සොයනවා නම් භික්ෂූනට අනියම් මඟින් කටයුතු පිරිමසා ගන්නට සිදු නොවන්නාක් මෙන් ම ගුණ දහම් දියුණු කර ගැනීමට ද ලොකු උපකාරයක් වෙයි.
2. ධර්මය අධිපති කොට ඇත්තෙක් වේ. ධර්මය හොඳින් ඉගෙන ගන්නටත් ඒ අනුව පිළිපදින්නටත් සියලු කටයුතු ධර්මානුකූලව කරන්නටත් බෞද්ධයන් විසින් ඉටා ගත යුතු ය.
3. තමන් ගේ ශක්තියේ ප්‍රමාණයට දන් දී බෙදා ගෙන අනුභව කරන්නෙක් වේ.
4. බුද්ධ ශාසනයෙහි පිරිහීම දැක එය නගා සිටුවීමට වෑයම් කරන්නෙක් වෙයි.

5. නක්ෂත්‍රාදියෙහි යම් කිසි සත්‍යයක් ඇතත් සුබ නැකත ම හැම යහපතට හේතු වේ යයි විශ්වාස නොකොට කර්මය හා කර්ම ඵලය අදහන සම්‍යක් දෘෂ්ටිකයෙක් වේ.

6. ජීවිතය නිසා වත් අන්‍ය ශාස්තෘවරයකු විශ්වාස නොකරන්නෙක් වේ.

7. කායද්වාරය ද වාග් ද්වාරය ද ආරක්ෂා කරන ලද්දේ වේ. සංවර කරන ලද්දේ වේ.

8. සමඟියට කැමති වේ. සමඟියෙහි ඇලුණේ වේ.

9. ඊර්ෂ්‍යා නොකරන්නේ අවංකව හුදු බැති සිතින් ශාසනයෙහි දියුණුවට කටයුතු කරන්නේ වේ.

10. බුද්ධ - ධම්ම - සංඝ යන ත්‍රිවිධ රත්නයේ ගුණ දැනගෙන තෙරුවන් සරණ යන්නේ කුමට දැයි වටහා ගෙන තෙරුවන් සරණ යෑම ද නියම බෞද්ධ ගුණයෙකි.

**පින්වත් බෞද්ධයෙනි, ඔබ නමින් පමණක් බෞද්ධයෝ ද නැතහොත් නියම බෞද්ධයෝ දැයි තමන් ගැන ම සිතා බලන්න. නියම බෞද්ධයකු තුළ අඩු ම ගණනින් තිබිය යුතු ගතිගුණ මෙහි සැකෙවින් සඳහන් වී ඇත. එකී ගුණ තමන් තුළ ඇති කර ගෙන නියම බෞද්ධයන් වන්නට තරයේ ඉටා ගන්නේ මැනැවි.**



# බුද්ධාගම හා සිංහල කොඩිය

*ශ්‍රී වජිරාරාමවාසී ව වැඩ විසූ පූජ්‍යපාද පඹුරන මෙත්තෙය්‍ය හිමිපාණන් වහන්සේ විසිනි*

සිංහලයා ඉතා ධර්මිෂ්ඨ බව විසි අවුරුද්දක් පමණ සිංහල කොඩිය හෙවණේ සිටි රොබට් නොක්ස් ලියා තිබේ. සිංහලයන් ගේ සාධාරණ කම සිංහලයන් නඩු විසඳු ආකාරයෙන් ම එළි විය. සිංහලේ විසූ ඉංග්‍රීසි ජාතිකයන් සමඟ කෝලාහල කරගෙන සිංහල විනිශ්චයකාරයන් ළඟට ගිය විට සිංහල විනිශ්චයකාරවරු 'මේ අපේ ඇත්තා ය, මේ පිටරැටියා ය'යි කිසි ම වෙනසක් නො කොට ඉතා ම ධර්මිෂ්ඨ ලෙස තීන්දුව දුන්හ. (නොක්ස් ගේ ලංකා විස්තරය, රයන් මහතා ගේ සංස්කරණයේ 208 පිටුව) අදත් සිංහලයා එදා වගේම ධර්මිෂ්ඨ මැ යි. කාටත් එක වගේ මෛත්‍රී කරයි. අනුකම්පා කරයි. සිංහල කොඩියෙන් කාටත් එක වගේ සුව සැනසිලි ලැබෙනවා ඇත.

සිංහල කොඩිය පිළිබඳ ප්‍රශ්නය ලංකාවට පමණක් සීමා වූවක් නොව, මුළු ලෝකය හා සම්බන්ධ ප්‍රශ්නයකි. සිංහල කොඩිය ඉතිහාසඥයන් විසිනුත් පුරා විද්‍යාඥයන් විසිනුත් මානව විද්‍යාඥයන් විසිනුත් ලලිත කලා විශේෂඥයන්

විසිනුත් සකල ශිෂ්ට ලෝකයා විසිනුත් ඉතා ම ගරු කරනු ලබන්නාවූ අනගි වස්තුවකි. **ලෝකයේ ඉතා ම අලංකාරවූත් ඉතා ම අර්ථවත්වූත් කොඩිය මෙයයි.** මේ උතුම් සිංහල කොඩිය තරම් පැරණි තවත් කොඩි ලෝකයේ ඇතොත් ඉතා ම ස්වල්පයෙකි.

## සිංහල කොඩිය ධර්මාශෝක මහරජ තුමාගෙන් ගෞරව ලැබීම.

ලෝකයේ ශ්‍රේෂ්ඨතම අධිරාජයායයි පෙර'වර දෙදිග මහපඬිවරයන් විසින් වර්ණනා කරන ලද ධර්මාශෝක මහරජතුමා තමාගේ මොනර කොඩියට මෙන් ම ලංකාවේ සිංහ කොඩියට ද ගෞරව කෙළේ ය. ඉර හඳ පවත්නා තෙක් ම සිංහල කොඩියට ගෞරව ලැබෙන සේ සාංචියේ මනරම් මහ තොරණක තේජස්වී සිංහ රූප සිතියම් කරවී ය. ඉතින් අවුරුදු දෙදහසකටත් වැඩි කාලයක් ලංකාවේ කොඩිය වශයෙන් ලෝකයේ ප්‍රසිද්ධ වූ ද දියුණු වූ සියලු ජාතීන්ගෙන් ගෞරව ලැබුවා වූ ද ආශ්චර්‍ය්‍ය අද්භූත කර්මාන්තයක් වූ ද මේ රමණීය සිංහධ්වජ රාජයා තිබියදී ලංකාවේ කොඩිය වශයෙන් අමුතු අලුත් කොඩියක් සාද ගන්නට යතොත් එය සකල ශිෂ්ට ලෝකයාගේ ම සංවේග යටත් බලවත් අප්‍රසාදයටත් හේතු වෙනවා ඇත.

පුරාණ උතුම් වස්තුවලට ගෞරවාදර දැක්වීම දියුණුවට හේතුවකැයි මහා කාරුණිකවූ බුදුරජාණන් වහන්සේ ලිච්ඡවීන්ට වදාළ හෙයින් දඹදිව් වැසියන් පුරාණ උතුම් වස්තුවලට ගෞරවාදර කරන බව රාජෙන්ද්‍ර ප්‍රසාද්තුමා කීවේ ය. ජාතික ලකුණක් නැත්තාවූ දඹදිව් වැසියෝ

පුරාණ උතුම් දේට ගෞරව කරමින් අශෝක චක්‍රය නමින් ප්‍රකට ධර්ම චක්‍රය ම නිදහස් දඹදිව ජාතික ලකුණ වශයෙන් තෝරා ගත් හ.

අනැගි පුරාණ වස්තුවක් වන සිංහල කොඩිය වෙනස් කරන්න යෝජනාවක් තියෙන බවත් අහන්න ලැබුණා. මේ කොඩිය වෙනස් කිරීම ශුද්ධ වස්තු කෙලෙසීමක් වශයෙන් ශිෂ්ට ලෝකයා පිළිගන්නවා ඇත. පාට තුනක් යෙදීම නැති භේද ඇති කිරීමක් වශයෙන් සමඟියට කැමති සියලු සත්පුරුෂයන් තේරුම් ගන්නවා ඇත. මේ අනැගි කොඩිය වෙනස්කොට පාට තුනක් යෙදීම ලෝකයේ සෙසු පඬිවරයන් ගේ ද සංවේගයට හේතු වෙනවා ඇත.

## සිංහලද්වීපයේ සමගිය

එංගලන්තයේ දී රාමනාදන් තුමා ඉගෙනීම ලැබූ විද්‍යාලයේ සඟරාවට එතුමාගේ මරණය ගැන ලියූ පින්වත් ඉංග්‍රීසි ජාතිකයා රාමනාදන් තුමා "සිංහල දෙමළෙකැ"යි ලීවේ ය. ඒ ඉංග්‍රීසි පින්වතා ලියූ ලෙස සිංහලද්වීපයේ උපන් රාමනාදන් තුමාට සිංහල නාමයත් සිංහල කොඩියත් අයිති මැ යි.

## "සිංහල මුස්ලිම්වරු"

ලංකාවේ මුස්ලිම්වරු "සිංහල මුස්ලිම්වරු"යයි ලෝකයේ ම මුස්ලිම්වරුන් ගේ නායකයා වන පින්වත් අගා ඛාන් කුමාරයා ලංකාවට ආ කාලයේ කීවේ ය. රාමනාදන්තුමාට මෙන් ම සිංහලද්වීපයේ උපන් සියලු

මුස්ලිම් පින්වතුනට ද සිංහල නාමයත් සිංහල කොඩියත් අයිති මැ යි. **ඉස්සර අදටත් වඩා බෙහෝ ජාතිකයෝ සිංහල කොඩිය හෙවණේ තමන් ගේ මවුපියන් ගේ ගෙයි මෙන් සමගියෙන් සතුටින් සුවයෙන් සැනසිල්ලෙන් විසූහ.** ඒ එක එක ජාතියක් වෙනුවෙන් සිංහල කොඩියේ පාට වෙනස් නො කරන ලදී. උතුම් පුරාණ සිංහල කොඩිය වෙනස් කරන්නට යෑම මුළු ලොවට ළයක් බඳු මේ දිවයිනේ නම වෙනස් කරන්න යෑමක් වැනි ය. **කොතරම් ඇළ දොළ ගංගා වැටුණත් මූද මූද ම යි. මූදු වතුර ලුණු රස ම යි. එමෙන් ම කොතරම් මනුෂ්‍ය ජාතීන් කලින් කල ඇවිත් එකතු වුණත් සිංහල ද්වීපය සිංහලද්වීපය ම යි. සිංහල කොඩිය අවුරුදු දෙදහස් ගණනක් පැරණි සිංහල කොඩිය මැ යි.** ඉන්දියාවේ අලුත් කොඩියේ පාට තුනක් තිබුණු පලියට ලංකාවේ පරණ කොඩියත් වෙනස් කොට පාට තුනක් යෙදීම කොටින් කියතොත් ඉන්දියාවේ දුම්රිය පළවල්වල "හින්දුවරුන්ට පැන් ය" මුස්ලිම්වරුන්ට පැන් ය" යි දෙතැනක දිය බඳුන් දෙකක් තිබුණු පලියට සමගිය අතින් මුළු ලොවට ආදර්ශ දෙන ලංකාවෙත් ඒ ඒ ජාතීන්ට වෙන වෙනම දිය බඳුන් තැබීමක් වැනියි. **අනේ එහෙම කරන්න එපා!** එහෙම කිරීමෙන් නැති භේද ඇතිවෙනවා. නේරු තුමා ස්වකීය භාර්යාවත් සමග ලංකාවට පැමිණි වාරයේ සිංහල කොඩිය ගැන සඳහන් කොට තමා පෙරළා ඉන්දියාවට යන්නේ පපුව ලංකාවේ තියල බව කීවේ ය. එහෙම කීවේ සිංහලයන් එතුමාට ප්‍රේමයෙන් සංග්‍රහ කළ නිසයි. ඊළඟට පැමිණි වාරයේ නේරු තුමා මුළු ලොවට වී තිබෙන විපත සඳහන් කරමින් මෙසේ කීවේ ය.

"අද මුළු ලොව ම ක්‍රෝධ කලහ විග්‍රහ හිංසා යුද්ධ යනාදියෙන් පීඩිතයි. එබැවින් භාරත මාතාව ගේ සියලු පුත්‍රයන් අතුරෙහි අතිශ්‍රේෂ්ඨ අත්‍යුත්තම පුත්‍ර රත්නය වූ බුදුරජාණන් වහන්සේ දඹදිව් වැසි අපටත් ලක්දිව් වැසි තමුන්නාන්සේලාටත් සියලු ජාතීන්ටත් වදාළා වූ ඒ අමරණීය සන්දේශය අප හැමදෙනා විසින් ම මෙනෙහි කට යුතු ය. අද වනාහි අන් සියලු ප්‍රස්තාවයන්හිදීටත් වඩා ඒ හිතකර ධර්මය සිහි කටයුතු ය."

"බුදුරජාණන් වහන්සේ විසින් අවුරුදු දෙදහස් පන්සියයකටත් පෙර ලෝකයාට දෙන ලද ඒ උතුම් සන්දේශය කවදාවත් පරණ නො වෙයි. ඒ ශාන්ත ධර්මය අදත් එද මෙන් ම අතිශයින් ම ඕජස් විය. ප්‍රාණවත් ය."

"බුදුරජාණන් වහන්සේ ගේ ඒ ශ්‍රේෂ්ඨ සන්දේශය අදත් අපගේ සිත් තුළ සාදරයෙන් ආරක්ෂිතව ඇත්තේ ය. වර්තමාන ලෝකයේ මේ කරදර පීඩාවන්ට භාජනය වන්නා වූ අපි ඒ සියල්ලට මූණපෑමටත් ඒ සියල්ල හා සටන් කිරීමටත් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මයෙන් එළියත් බලයත් උද්යෝගයත් සොයන්නෙමු."

## ශාක්‍ය සිංහයාණන් වහන්සේ සිහිකරවන කොඩිය

සියලු ආගම්වලත්, සියලු ජාතිවලත්, ගුණවන්තයන්ට සිංහල කොඩිය මහා කාරුණික වූ බුදුරජාණන් වහන්සේ සිහිපත් කරවයි. ශාක්‍යසිංහ යනු තිලොවෙක මිතුරු බුදුරජාණන් වහන්සේට නමකි. ශාක්‍ය සිංහයාණන් වහන්සේ බෝමැඩ දී වීරිය නැමැති අතින්, ඤාණ

නමැති කඩුව ගෙන, සියලු කෙලෙස් සතුරන් නැසූ බව, බණ පොතේ සඳහන් වේ. අතින් කඩුව ගෙන සිංහල කොඩියේ වැජඹෙන සිංහරාජයා දකින කොට, මහ බෝමැඩ දී නැණ කගින් කෙලෙස් සතුරන් වැනැසූ ශාක්‍යසිංහයාණන් වහන්සේ මතක් වෙනවා, වඳින්න හිතෙනවා, එංගලන්තයට ගෙන යන ලද එක් පැරණි සිංහල කොඩියක කොන් හතරේ බෝකොළ හතරක් තියෙන නිසා සිංහල කොඩිය විශේෂයෙන් ම මෙත් මුහුදු බුදුරජාණන් වහන්සේ සිහිපත් කරවනවා. දීප බන්ධු චාල්ස් ඇන්ඩ්රූස් දෙව්ගැති තුමා ඒ බුදුරජාණන් වහන්සේ හා සමගිය ගැන මෙසේ කීවේ ය. "දෙවිසි වසකට පෙර මම පළමු වරට දඹදිව පා තැබීමි. මහා කාරුණික වූ ගෞතම බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රී චරිතය එද සිට ම මා කෙරෙහි බල පවත්වයි. කල් යත් යත් බුදුරජාණන් වහන්සේ ගේ ධර්මකාය වඩ වඩාත් මා වසඟ කරයි. බුදුරජාණන් වහන්සේ අවුරුදු දෙදහස් පන්සියයකට පෙර උගන්වා වදළා වූ ඉවසීම, මෛත්‍රිය යනාදී ගුණ ධර්මයන් අමතක කළ නිසා අද ඉන්දියාව භේද වී තිබේ. යුරෝපයත් භේද වී තිබේ. අතීතයෙහි ආසියාව අතිශයින් ම සමඟි කළ ධර්මය නම් බුද්ධ ධර්මය යි. බුදුරජාණන් වහන්සේ සියලු මිනිසුන්ට ම අයිති බවත්, සියලු මිනිසුන් ගේ යහපත සඳහා පහළ වූ බවත්, මම ඉගෙන ගතිමි. බුදුරජාණන් වහන්සේ ලෝ පහළ ව ධර්ම රාජ්‍යය පිහිටුවන්නට පෙර පලිගැනීම ලෝ පතළ සිරිතක් විය. එහෙත් පලිගැනීම සත්පුරුෂයන් ගේ ප්‍රකෘති ධර්මය නොවන බවත්, වෛර කරන්නා කෙරෙහි කරුණා මෛත්‍රිය පැතිරවීම ම නියම ධර්මය බවත්, බුදුරජාණන් වහන්සේ ප්‍රකාශ කළ සේක.

ලෝක ඉතිහාසයේ පළමුවරට මෙසේ අවිහිංසාව උගන්වා **අසාධුං සාධුනා ජිනේ** යන අළුත් ආදර්ශ පාඨයක් දෙන ලද්දේ බුදුරජාණන් වහන්සේ විසිනි. ඒ නිසා ලෝකයේ ස්වර්ණ යුගයක් උදා විය."

ඉතින් ලොවට අනුකම්පා කරන අපේ හොඳ සිංහලයෝ ද සමඟියෙහි පිහිටා නැවතත් ලංකාවේත් ලෝකයේත් ස්වර්ණ යුගයක් ඇති කරන්නට රෑ දවල් දෙක්හි මහා වීරිය වඩත්වා! **කිසි වෙනසක් නැතිව කාටත් එකවගේ සංග්‍රහ කළ යුතු බවත් අනුන් ගේ දුක දුටු වහා ම දුරුකළ යුතු බවත් සිංහල රජතුමා දඹදිව මහ බෝමැඩ සිංහල සංඝාරාමයේ තඹ පුවරුවක ලියා තැබුවේ ය.**

ලෙයින් මසින් පිරි- මේ සිරිර මෙතින් කලුණින්

දරමි සත් වැඩ පිණිස ම- ලොවට හිත සුව පිණිස ම

යයි සිංහල මහාවීර සිරිසඟබෝ මහ රජතුමා කීවේ ය. "**සවෙ මුනිසෙ පජා මමා**" යනුවෙන් "**හැම මිනිස්සු ම මගේ දරුවෝ ය**"යි ධර්මාශෝක මහරජතුමා කීවේ ය. අපේ ගුණවත් සිංහලයන්ට ද එසේ කිය හැකියි.

'**මම් යෙ අස්වසෙයු ච මෙ සුඛංමෙව ච ලභෙයු මමතෙ නො දුඛං**' යනුවෙන් 'මගෙන් ලොවට සැනසිල්ල ම ලැබේවා! සුවයක් ම ලැබේවා!! මගෙන් දුකක් නම් නොවේ වා! යී ද ධර්මාශෝක මහරජතුමා ලීවේ ය. අපේ ගුණවත් සිංහලයන් ගෙනුත් මුළු ලොවට ම උතුම් සැනසිල්ල ම ලැබේවා! සෙත් සුව ම ලැබේ වා! දුකක් නම් නො ලැබේවා!

සීරද දද රද                                දිදිලේ
සව්සත නිති                                සැනසිල්ලේ
කැත් මෙත් මහ                              කුලුණැල්ලේ
සැරදෙත් හෙළ                               හෙවණැල්ලේ

සිංහ රාජ ධජ රාජයාගේ ආලෝකයෙන් ඒකාලෝක වූ සිංහල ද්වීපයෙහි මච්චත් සිංහලයන් ගේ හෙවණැල්ලේ ක්‍ෂාන්ති මෛත්‍රී මහාකරුණා ධාරාවෙහි සිහිලස් විඳිමින් සියලු සත්ත්වයෝ ම නිරතුරු සැනසිලි ලබමින් බොහෝ කල් ජීවත් වෙත් වා!.

**සමගිය වැඩේවා! - සෙත් සුව ළැගේවා !!**

● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ● ●

## ප්‍රශංසා කළ යුතු බියසුල්ලා

යො පාණභූතෙසු අහෙඨයං චරං
පරූපවාද න කරොති පාපං
භීරුං පසංසන්ති න තත්ථ සූරං
භයා හි සන්තො න කරොති පාපං

**(සංයුක්ත නිකාය)**

පණ ඇති කිසි සතකුට හිංසා නොකරමින් හැසිරෙන යමෙක් පරූපවාදයට (අනුන්ගෙන් ලැබෙන අපවාදයට) බියෙන් පව් නො කෙරේ ද මේ කාරණයෙහි ලා බියසුල්ලාට ම පණ්ඩිතයෝ පසසති. සත්පුරුෂයෝ බිය නිසා පව් නො කරති.



# සති පාසලට
# ඔබ හැම පිය මැන එන්න

*පුත්තලම, ඉහළ පුලියන්කුළම ප්‍රවචනාකර පිරිවෙනේ*
*පූජ්‍ය අමුණුකොළේ සිරිවිමල, පූජ්‍ය මැදවච්චියේ සීලානන්ද*
*කුඩා ස්වාමීන් වහන්සේ දෙනම ගේ නිර්මාණයකි*

සිරි ලංකාව මතුවට තව රැකගන්න
සන්සුන් ගතිය මිනිසුන් තුළ ඇතිවන්න
සති පාසලේ දොර සැමට ම ඇර දෙන්න
ආගම් - ජාති අත හැර දෙසවන් දෙන්න

ඉගැනුම දෙන්න පාසල වෙත පිය මැන්න
ගුරු භවතුනට වුව වැදගති, දැන ගන්න
දරුවන් වන ඔබ ද මෙය වටහා ගන්න
'සතිය' නම් කිමැ යි නුවණින් විමසන්න

මගද බසින් 'සති' යනුවෙන් පැවසෙන්නේ
'සිහිය' ලෙස යි එය අප හෙළ බස ගන්නේ
කරන හැම දෙය ම සිහියෙන් විමසන්නේ
නිවුමේ මඟට එයිනු යි මුල ඇරඹෙන්නේ

පමා නො වී හැම කටයුතු කර ගන්න
කරන කියන දෙය සිහියෙන් ඔප ලන්න
සතිමත් බවේ සුමිහිර අත් විඳ ගන්න
එහි ඇති අරුත දිවියෙන් අත්දැක ගන්න

නිහඬ ව සමබර ව අසුනෙහි ඉඳ ගන්න
චංචල සිතෙහි නිසසල බව සරසන්න
පවතින මෙකය වෙත ඔබ සිහි රඳවන්න
ඉපදෙන - බිඳෙන කය නුවණින් සලකන්න

වනයෙන් ගෙනත් ගම ගෙදරක බැඳ ඉන්න
කුළු හරකෙකු දෙසට දැන් සිත ගෙන යන්න
හැකි වෙ ද කෙරුම් කවි කර දැන් පවසන්න
මේ සිත එ ලෙස ම යි, ඒ බව දැන ගන්න

'සතිය' ඇතැයි අප කොහොම ද දකින්නේ
'සතිය' නිස යි සිත අප හට දැනෙන්නේ
කයේ සැහැල්ලුව සිතට යි දැනෙන්නේ
සතිය ඇති විට යි ඇති තතු පෙනෙන්නේ

හිඳිනා විට දි ඔබ ඒ බව දැන ගන්න
යන එන විට දි ඒ බව ඔබ දැන ගන්න
කන බොන හඬන හිනැහෙන තැන හඳුනන්න
එය ම යි 'සතිය' ඒ බව තේරුම් ගන්න

පොත පත බලන ලියනා කියවන අයට
ජලයෙන් උඩින් පොළොවේ ඇවිදින අයට
ගොවිකම් වෙදකම් ද ගුරු කම් දෙන සැමට
ඇවැසි යි 'සතිය' දුප්පත් පොහොසත් සැමට

අලුයම අවදි වන කල සිහියෙන් ඉන්න
'මම පිබිදෙමි' යි සිහියෙන් එය දැන ගන්න
දත් මදිනා විට ද සිහියෙන් සලකන්න
'සතිය' ම වැඩෙන මඟ ඉදිරියට ම යන්න

පාසල් යන විට පිය මනිමින්නේ
බසයට නඟිනා තෙක් පැමිණෙන්නේ
හැම තැන පය වෙත සිත යොමමින්නේ
'සතිය' වඩමිනු යි පාසල් යන්නේ

සවසට පාඩම් කරන වෙලාවේ
සතියෙන් ඒ වැඩ ටික ද නිමා වේ
සතුටක් දිවියට නිබඳ ව යා වේ
සතිය නිසා හොඳ උගතෙක් බිහිවේ

සවසට ඉටු දෙවියන් නමදින්නේ
නිදියන්නට යහනට පිවිසෙන්නේ
නිඳනා කය දෙස හොඳින් බලන්නේ
නිදන විට ද එම 'සතිය' වඩන්නේ

සතිය වඩන දරුවෙක් රට බිහි වේ
සියලු දියුණුවට සතිය ම මුල වේ
රටට ම සුබ සෙත හැම විට හිමි වේ
සතිය නිසා නිවන ද ළං ළං වේ



# පින්වත් දරුවෝ බෝසත් සිත් ඇත්තෝ ය

*සිරිවජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය*
*ශාස්ත්‍රවේදී පූජ්‍ය මීගොඩ සුබිත හිමිපාණන් විසිනි*

**අනාථානාමහං නාථඃ - සාර්ථවාහශ්ච යායිනාං**
**පාරෙප්සූනාං ච නෞ භූතඃ - සෙතුඃ සංක්‍රම එව ච**

**දීපාර්ථිනාමහං දීපඃ - ශය්‍යා ශය්‍යාර්ථිනාමහං**
**දාසාර්ථිනාමහං දාසො - භවෙයං සර්වදෙහිනාම්**

**- බෝධිචර්යාවතාරය**

දුවේ, පුතේ, මේ ශ්ලෝක දෙක අපට හමුවන්නේ බෝධිචර්යාවතාරය කියන පොතේ. බෝධිචර්යාවතාරය කියන්නේ මහායාන බෞද්ධ සම්ප්‍රදායට අයිති පොතක්. අපේ සම්ප්‍රදාය වන ථේරවාද බෞද්ධ සම්ප්‍රදායට වඩා මහායාන බෞද්ධ සම්ප්‍රදායේ වෙනස්කම් තිබෙනවා. එහෙත් බෝධිසත්ත්ව සංකල්පය පිළිබඳ වටහා ගැනීමට නම් බෝධිචර්යාවතාරය පොතෙන් අනල්ප ආලෝකයක් ලැබෙනවා.

"බෝධි" යනු බුද්ධත්වය හෙවත් මහා අවබෝධය හැඳින්වීමට යෙදෙන පදයක්. "සත්ත" යනු "ඇලෙන" "කැමතිවෙන" යන තේරුම තිබෙන පදයක්. එතකොට "බෝධිසත්ත" කියලා කියන්නේ "බුද්ධත්වයට කැමති" වූ "බුද්ධත්වයෙහි ඇලුණු" යන

අදහස යි. මතු බුදු බව පිණිස පාරමී පුරන උතුමන්ට තමයි " බෝධිසත්ත" කියන වචනය භාවිත වෙලා තිබෙන්නේ. බුදු බව පතන උත්තමයන් සංසාරේ බොහෝ කලක් ඒ වෙනුවෙන් පාරමී ගුණ පුරාගෙන ගමන් කරනවා. ඉක්මනින් සසරින් එතෙර වීමට පින් තිබුණත් ලෝක සත්ත්වයා කෙරෙහි මහත් කරුණාවෙන් බුදු බව කැමති බෝසත්වරුන් දුක් විඳ විඳ සසර ගමන් කරනවා. බෝසත්වරුන් කෙලෙස් දුරු නොකරන නිසා උන්වහන්සේලාටත් අපට වගේ ම කෙලෙස් තිබෙනවා. සසර නොයෙක් අඩු පාඩු වෙනවා. එහෙත් බොසත්වරුන් අන් කාටත් වඩා ලෝකයාට උපකාර කරමින් දුක් විඳින සත්ත්වයා වෙනුවෙන් ම කැප වෙමින් අප්‍රමාණ ගුණ පුරනවා. දුවේ, පුතේ මේ ශ්ලෝක දෙකෙහි අදහස බලන්න. බොසත් උතුමන් සංසාරේ අප වෙනුවෙන් කොපමණ කැප වෙනවද කියලා එයින් වැටහෙනවා.

"මම අසරණයන්ට සරණ වෙමි. මඟට පිළිපන් මඟියන්ට මඟ කියන සාත්තුවාහකයෙක් වෙමි. ගංගා ආදියෙන් එතෙර යනු කැමතියනට නැවක් වෙමි. එතෙර වනු කැමතියනට ඒ දණ්ඩක් වෙමි. අඳුරෙහි සිටින්නවුන්ට පහනක් වෙමි. සැතපෙනු කැමතියනට සුව යහනක් වෙමි. දාසයන් කැමතියනට දාසයෙක් වෙමි. සියල්ලන්ට කැමති කැමති වස්තුව දෙමි."

මේ බෝසත් සිත මතු බුදු බව පතන බෝසත්වරුන් ගේ තරමින් ම නොවුණත් අපටත් දියුණු කර ගැනීමට නොහැකි එකක් නෙමෙයි. බලන්න දුවේ, පුතේ, ධනය, බලය, කීර්තිය කැමති වෙන ලෝකයේ අනෙකා ගැන නොහිතන නපුරු මිනිසුන් නිර්මාණය වෙනවා. ඒ නපුරු මිනිසුන් ගේ හදවත්වල ආදරය, කරුණාව, මනුෂ්‍යත්වය සිඳී සිඳී යනවා. කාට හෝ පුළුවන් නම් මේ බෝසත් සිත ටික ටික දියුණු කරන්න ඒ තැනැත්තාගේ / තැනැත්තියගේ හදවතේ පුංචි බෝසත්වරයකු උපදිනවා. සීලය වගේම ගුණයත් දියුණු වෙන්න අවශ්‍ය යි. සීලය

වටින්නේ ගුණය දියුණු වූ තරමට යි. ගුණය වටින්නේ සීලය දියුණු වූ තරමට යි. අප රට ජාතිය දියුණු කරන්න කොපමණ කතා කළත් අපේ හදවත් ගුණයෙන් දියුණු නැත්නම් සමස්තයේ දියුණුවක් අපේක්ෂා කරන්න බැහැ. ආත්මාර්ථකාමී පටු අදහස් තිබෙන ලාභ, ලෝභ, කීර්ති, ප්‍රශංසාවලට ම කැමති පිරිසක් මැද බෝසත් ගුණ දියුණු කිරීම නම් හරිම අමාරුයි. එහෙත් අපේ මහබෝසතාණන් වහන්සේත් මේ ගුණ බොහොම අමාරුවෙන් අධිෂ්ඨානයෙන් දියුණු කළ බව සිත සිතා මේ ගුණ දියුණු කළ යුතු යි.

යම් තැනක බෝසත් ගුණ දරන පිරිස වැඩි වෙන කොට එතැන ගුණයෙන් බබළනවා. අද බොහෝ දෙනා බැබළීම කියා අදහස් කරන්නේ බාහිර ඔපය යි. ඇතුළත ගුණ නොවෙයි. එහෙත් නියම බැබළීම නම් ගුණයෙහි බැබළීම යි. යම් නිවසක්, ආයතනයක්, පාසලක්, දහම් පාසලක්, වුවත් ඇත්තට ම බැබළීමට නම් එතැන බෝසත් ගුණ දරන පිරිස වැඩි විය යුතු වෙනවා. නපුරු අදහස් තිබෙන, කුහක අසත්පුරුෂ පිරිස බලවත් වෙන කොට නො දැනීම ඒ ආයතන අඳුරට යනවා. ඒ නිසා බෝසත් ගුණ දරන දරුවන්, බෝසත් ගුණ දරන මිනිසුන් මේ හැමතැනට මත් රටටත් අවශ්‍ය කාලය හොඳට ම ඇවිත් තිබෙනවා. මුළු රට ම බැබළීමට නම් බොසත් ගුණ දරන මානව පරපුරක් බිහි විය යුතු බව අප විශ්වාස කරනවා.

දුවේ, පුතේ, මාර්ග ඵල ලබනවාට දහමේ කියන්නේ උත්තර මනුෂ්‍ය ධර්ම කියල යි. උත්තර මනුෂ්‍ය ධර්ම උපද්දවන්න නම් මනුෂ්‍ය ධර්ම දියුණු කළ යුතු යි. උත්තර මනුෂ්‍ය ධර්මවල උපරිම අවස්ථාව බුදු රජාණන් වහන්සේ නම් මනුෂ්‍ය ධර්මවල උපරිම අවස්ථාව බෝසතාණන් වහන්සේ විය යුතු යි. අපත් ඒ මහබෝසත් ගුණ වඩමින් උත්තම මානව සම්ප්‍රදායක් උදෙසා බෝසත් පරපුරක් නිර්මාණය කරමු.



# කඨිනයේ අනුසස්

*සිරි වජිරාරාමවාසී ශාස්තෲපති පූජ්‍යපාද*
*කුරුණෑගල චරණධම්ම හිමියන් විසිනි*

පසුගිය කලබ හා සබැඳේ

පින්වත් දුවේ පුතේ අප පසුගිය පොහෝ දින වස්සාන සමය පිළිබඳ කරුණු රැසක්ම ඉගෙන ගත්තා. වස් සමය හමාර වී චීවර මාසය නැත්නම් කඨින පින්කම් සිදුකර ගත හැකි කාලයත් අදින් අවසන් වන නිසා අපි කඨිනානිශංස ගැන අද ඉගෙන ගනිමු. මේ වන විට පින්වත් ඔබත් කඨින පින්කම් ගණනාවකට සහභාගී වුණා වෙන්න පුළුවන්. ඒ තුළින් ඔබ ලද ආනිශංස කොපමණද යන්න හොඳින් ඉගෙන ගැනීම ඒ ගැන සිතා සතුටුවීමටත්, තවත් කුසලයන්ට නැඹුරුවීමටත් උපකාර වෙනවා.

කඨිනානිසංශ ගැන කථා කරන විට අපට එය කොටස් දෙකකින් කථා කරන්න පුළුවන්. කඨින චීවරය හා ඒ සම්බන්ධව සිදුකරන අනෙකුත් පූජාවන් සිදුකිරීමෙන් ගිහි පින්වතුන්ට ලැබෙන ආනිශංස සහ පූජා කළ කඨින චීවරය සංඝයා විසින් පැවරීම සිදු කරන භික්ෂුවට ලැබෙන ආනිශංස ලෙසයි.

පළමුවෙන් අපි කඨින පූජාව සිදුකරන ගිහි පින්වතුන්ට ලැබෙන ආනිශංස මොනවාදැයි බලමු. කඨිනානිශංස පිළිබඳ සවිස්තරාත්මක විග්‍රහයක් දැකිය හැකි බෞද්ධ ථේරවාද මූලාශ්‍රය ලෙස වියතුන් පිළිගන්නේ නාගිත ථේරාපදානයයි. එහි දී නාගිත මහරහතන්වහන්සේ පෙර අත්භවයක දී විපස්සී බුදුන් දවස කඨින පින්කමක් සිදුකර ඒ නිසා ලද ආනිශංස විස්තර කර දී තිබෙනවා. එම විස්තරය මුළුමනින්ම මෙහි දී සඳහන් කිරීමට අපහසු වුවත් අවශ්‍ය කරුණු සලකා බැලීම අවශ්‍ය වෙනවා.

'කඨින'යන වචනයෙන්ම තද බව, නොබිඳෙන, නොකැඩෙන බව අදහස් වේ. කඨින චීවර දානමය පින්කමත් ඒසා විශාල, නොකැඩෙන, නොබිඳෙන බලවත් පුණ්‍යකර්මයක් බව සඳහන් වේ.

"පඨවිරිව න ජාතු කම්පතේ
න චලති මේරුරිවාති වායුනා
වජිරම්ව න භිජ්ජතේ ඝනං
තවිධමතෝ කඨිනන්ති වුච්චති"

මේ ගාථාවට අනුව මහ පොළොව මෙන් වූ මහ සුළඟකට නොසෙල්වෙන මහමෙර සේත්, ඒක ඝන වායු පර්වතයක් මෙන් නොබිඳෙන සුළු වූත් ස්ථාවර පුණ්‍යස්කන්ධයකි, කඨින චීවර දානය. ථේරවාද සම්ප්‍රදායේ එන අට මහා පින්කම් වලින් පළමු ස්ථානය ලැබී ඇත්තේ කඨින චීවර දානයටයි. ඒ ආනිශංස පක්ෂය සලකාගෙනයි. අන් සෑම පින්කමක් ම නිතර කළ හැකි වුවත්, කඨින පින්කමක් වසරකට එක් ස්ථානයක එක්වරක් පමණක් කළ හැකි පින්කමක්. ඒ නිසා ද එය සුවිශේෂී වෙයි. කඨිනයක් පෞද්ගලිකව පූජා කළ නොහැකි අතර එය මහා සංඝයා

විෂයෙහි පූජා කළ යුතු වේ. මහා සංඝයාගේ අනුමැතියෙන්, විනයකර්මයකින් එය එක් භික්ෂුවකට පවරනු ලැබේ. කඨින චීවරයක් පිදීමෙන් ලැබෙන ආනිශංස කඨිනය සමඟ පුදන සෙසු පරිෂ්කාර පූජාවෙන් පවා ලද හැකි ය. සාමාන්‍ය පින්කමකින් ලැබෙන කුසල විපාකය කඨින චීවර දානයකින් ලැබෙන කුසල විපාකයකින් දහසයෙන් පංගුවක් නැවත දහසයකට බෙදූ විට ලැබෙන කොටසක විපාකයට සමාන වේ යැයි පැවසේ. ඒ තරම් විශාල කුසල විපාකයක් කඨින චීවර දානයෙන් ලැබේ.

කඨිනය විපාක දීම් වශයෙන් ගතහොත් ආනන්තරීය අකුසල් හැර අනෙක් සියලු අකුසල් යටපත් කර මරණාසන්න අවස්ථාවක දී විපාකය සලසා දෙන බල සම්පන්න කුසල විපාකයකි. කාම සුගති භවයන්හි ඉපදීමට හේතු වෙයි. මිනිස් ලොව උසස්ම සම්පත ලෙස සලකන සක්විති සම්පත්, දෙව්ලොව ශක්‍ර සම්පත් ලැබීමට හේතුවන පුණ්‍ය කර්මයකි.

නාගිත ථේරාපදානයට අනුව උපන් භවයක් පාසා මිනිස් භවයක් නම්, උසස් කුලයෙහි ඉපිද මහත් සම්පත්ලාභී වන අතර දෙවියන් අතර ඉපදී නම් සැමට ප්‍රිය අයෙක් වන්නේ ය. මේසා සුවිශාල බලවත් ආනිශංස කඨින චීවර දානයෙන් ලද හැකි ය. ඒ ගිහි පක්ෂයට ලද හැකි කඨින ආනිශංස ය.

කඨින චීවරයක් සඟ සතු කර පිදූ පසු එය මහා සංඝයා එක්ව සීමාවකට රැස්ව විනයකර්මයකින් එක් භික්ෂුවකට පැවරීම සිදුකරයි. ඒ සඳහා වස් සිඳනොගත් මහාපවාරණයෙන් පවාරණය වූ භික්ෂුවක් විය යුතු ය. මෙම විනය කර්මය කඨිනය ඇතිරීමේ විනය කර්මය ලෙස හඳුන්වයි.

කඨිනය පැවරනු ලැබූ භික්ෂුව විසින් කළ යුතු කාර්යය කීපයකි. කඨිනය ලෙස ලබන ලද චීවරයට සමාන තමන් පරිහරණය කරන චීවරය (කඨිනය ලෙස ලද සිවුර තනි පොට සිවුරක් නම් තමන් භාවිත කරමින් සිටි තනිපට සිවුර) පච්චුද්ධරණය කොට (අධිෂ්ඨාන අවලංගු කොට) කඨිනය ලෙස ලද චීවරය අධිෂ්ඨාන කර එහි කප් බිංදු තබා දුර්වර්ණ කොට කඨිනය ඇතිරීම සිදු කළ යුතු ය. කඨිනය අතුරනවාත් සමඟම එම භික්ෂුවට අනුසස් පහක් ලැබේ. එම ආනිශංස මැදින් පොහොය දක්වාම බල පැවැත්වේ. කඨිනය ලැබූ භික්ෂුව විහාරයේ අනෙකුත් උපසපන්, වස් සිඳනොගත් භික්ෂූන්ටත් අනුමෝදන් කිරීම චාරිත්‍රයයි.

එමඟින් ලැබෙන ආනිශංස 5 මෙසේ ය.

## 1. අනාමන්තචාරය

සාමාන්‍යයෙන් භික්ෂුවක් විහාරයේ කවරකුට හෝ නොදන්වා බාහිරට යෑම වරදකි. කඨිනය ඇතිරූ භික්ෂුව එම වරදින් නිදහස් වේ. එනම් නොදන්වා විහාරයෙන් බැහැර වීමේ හැකියාව ලැබේ.

## 2. අසමාදානචාරය

සාමාන්‍යයෙන් උපසපන් භික්ෂූන් අධිෂ්ඨාන කොට ගත් තුන් සිවුරෙන් විසිය යුතු වුවත්, කඨිනය ඇතිරූ භික්ෂුවට තුන් සිවුරෙන් බැහැරව විසීමේ හැකියාව පවතී.

## 3. ගණ භෝජනය

ගණ භෝජනය නම් කිසියම් දායකයකු මිත්‍රත්වයෙන් කරන ආරාධනයක් සේ සලකා භික්ෂූන් හතරනමක් හෝ වැඩි ගණනක් පැමිණ දානමය පිංකමක් වශයෙන් නොව පෞද්ගලික සංග්‍රහයක් ලෙස වැළඳීමයි. මෙය වරදකි.

එහෙත් කඨිනය ඇතිරූ භික්ෂුවට නියමිත පස් මාසය තුළ ගණ භෝජනය වැළඳීමෙන් ඇවැත් සිදු නොවේ.

## 4. යාවදත්ථචීවරය

සාමාන්‍යයෙන් උපසපන් භික්ෂූන් අදිටන් කළ තුන් සිවුරට අමතරව ලැබෙන සිවුරු සාංඝික ගබඩා ක්‍රමය වන විකප්පනය නොකොට දස දිනකට වඩා තබාගැනීම ඇවතකි. එහෙත් කඨිනය ලද භික්ෂුව අධිෂ්ඨාන හෝ විකප්පනය නොකළ සිවුරු දැරීමේ වරප්‍රසාදය හිමිවේ.

## 5. යො ච තත්ථචීවරුප්පාද

කඨිනය ඇතිරූ භික්ෂූන්වහන්සේට කඨිනානිශංස නියමිත පස් මාසය තුළ වස් විසූ ආරාමයේ සැදැහැවතුන් විසින් සගසතුකොට පුදන ලද පිරිකරවල අයිතිය හිමි වේ.

මෙම අනිශංස පහ කඨිනය ඇතිරූ භික්ෂුවට වප් මස අවපෑළවියේ පටන් මැදින් පොහෝ දින දක්වා ලැබේ. මේ ආකාරයට ශික්ෂාවලින් නිදහස් වී වරප්‍රසාද හිමිවන්නේ ලෞකික ලාභ අපේක්ෂා පිණිස, තම අභිමතය පරිදි කටයුතු කිරීමට වඩා ශාසනික වත්පිළිවෙත් සපුරා තව තවත් ගෞරවයෙන් පැවිද්ද අභිරමණය කිරීමටයි.

මේ ආකාරයට ගිහි පැවිදි දෙපාර්ශ්වයට ම මහත් ආනිශංස ගෙනදෙන මහා පින්කමක් වන කඨින පූජාව ජීවිතයේ එක් වරක් හෝ සිදු කිරීමට අධිෂ්ඨාන කර ගැනීම දෙලොව යහපත පිණිස ම පවතී.